පටුන

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 1

1.3 ප්‍රධාන කාර්යයන් 3

1.4 සංවිධාන සටහන 4

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු 5

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා අරමුදල් 5

1.7 විදේශ අධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 5

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 6

2.1 ප්‍රගතිය 6

2.2 විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි ඉලක්ක 9

03. පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය 12

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 12

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 13

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 14

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 15

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 16

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 16

3.7 මු.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 16

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 16

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක 31

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 31

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 32

5.1 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය 32

5.2 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 33

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 34

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 34

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය 34

6.3 මානව සම්පත් සංවර්ධනය 35

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 39

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2019.12.10 දිනැති අංක 2153/12 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශය ලෙස ස්ථාපිත වූ මෙම අමාත්‍යාංශය පසුව 2020.08.29 දිනැති අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය හා 2020.12.11 දිනැති අංක 2205/14 අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් වෙළෙඳ අමාත්‍යාංශය ලෙස ස්ථාපිත වී ඇත.

පාරිභෝගිකයින් ගේ අයිතීන් ආරක්ෂා කරමින් තරගකාරී දේශීය වෙළෙඳ ජාලයක් හරහා ජනතාව වෙත අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා දීම සඳහා කටයුතු කිරීම, වෙළෙඳ අංශයේ නායකත්වය සපයමින් සේවා හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් කටයුතු කිරීම, ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම, එම වෙළෙඳ ප්‍රතිපත්තිය නියාමනය කිරීම හා ක්‍රියාත්මක කිරීම මඟින් ශ්‍රී ලාංකිකයන්ගේ එදිනෙදා පරිභෝජන භාණ්ඩ හා සේවා වල ගුණාත්මකභාවය ඉහල නැංවීම තුළින් ජීවන තත්ත්වය ඉහළ මට්ටමකින් පවත්වාගෙනයාම සඳහා වෙළෙඳ අමාත්‍යාංශය ඍජුව දායක වේ. තවද, ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා වෙළෙඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන සම්බන්ධීකරණය කිරීම ද එම අමාත්‍යාංශයේ මූලිකම කාර්යයකි. තවද, ආනයන හා අපනයන කටයුතු නියාමනය සඳහා දායකත්වය සැපයීම තුළින් ජාත්‍යන්තර වෙළෙඳාම ඉහළ නැංවීමටත්, විදේශ විනිමය උත්පාදනයටත්, වෙළෙඳ අමාත්‍යාංශය ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරනු ලැබේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

‘‘තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක්’’

මෙහෙවර

වෙළෙඳ අංශයේ නායකත්වය සපයමින් සේවා හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිෂ්පාදකයන්, වෙළෙන්දන්, මිනුම් විද්‍යා හෝ වෙනත් සේවා සපයන්නන් සහ පාරිභෝගිකයන්ගේ සමානත්වය හා වෙළෙඳ අයිතීන් තහවුරු කරන දේශීය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම හා ඒවා නියාමනය කිරීම මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ සබඳතා වැඩිකර ගැනීමට ද්වීපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් සඳහා එළඹීම තුළින් නව වෙළෙඳපල අවස්ථා හිමි කරගැනීමටත්, ශ්‍රී ලාංකිකයින්ගේ එදිනෙදා පාරිභෝජන භාණ්ඩ හා සේවා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් ඉහල ජීවන තත්ත්වයක් පවත්වා ගෙන යාමටත් දායක වීම.

අරමුණු

1. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් තුළින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරැකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම.

2. වෙළෙඳපොළ තුළ භාණ්ඩ වල මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවන්හිදී, එළවළු, පළතුරු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම.
3. විවෘත තරගකාරී වෙළෙඳපොළ පරිසරයක ලංකා සතොස සමාගම, සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව වැනි රාජ්‍ය ආයතන හරහා පාරිභෝගිකයන් වෙත සහනදායී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම සිදු කිරීම.
4. වෙළෙඳ ප්‍රජාව මෙන්ම පාරිභෝගිකයින්ගේද ප්‍රයෝජනය පිණිස මිණුම් ඒකක ප්‍රමිතින් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහතික වීම.
5. ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා රට තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආරක්ෂක තොග (Buffer Stock) පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික රාමුව මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
6. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාල දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම.
7. ජාතික වශයෙන් අපනයනය දිරිමත් කිරීම සඳහා නෛතිකමය සහාය, උපදේශක දායකත්වය ලබාදීම.
8. දේශීය නිෂ්පාදනයන් හා අපනයන භාණ්ඩවල, නිසි ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අදාල විධිවිධානයන් සංවිධානයට මඟපෙන්වීම.
9. අධ්‍යාපනයේදී, උසස් අධ්‍යාපනය සඳහා දරු දැරියන් දිරිමත් කිරීමට අදාළ සුභසාධන ක්‍රියාවලීන් පවත්වා ගෙන යාමට දායකත්වය ලබාදීම.
10. ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම.
11. ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කරගෙන යනු ලබන අනුකූලතා තක්සේරු ප්‍රතිඵල සේවා සහතික කිරීමට අදාළ මඟපෙන්වීම.
12. ශ්‍රී ලංකාවේ ආර්ථික හා වාණිජ අභිරුචීන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමට, ජාත්‍යන්තර වෙළෙඳපළ අවස්ථා සඳහා අපනයනකරුවන් දිරිගැන්වීමට අවශ්‍ය ආයතනික පසුබිම සකස්කරදීම හා ඒ හා සම්බන්ධිත ආයතන දිරිගැන්වීම.
13. අදාළ ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වශයෙන් රටවල් සමඟ ගිවිසුම්ගතවීම් වලදී මඟපෙන්වීම හා සම්බන්ධීකරණය.
14. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වරණීය පාද ක්‍රමය (GSP) අන්‍යොන්‍ය නොවන වෙළෙඳ ගිවිසුම්(NMTR), නිදහස් වෙළෙඳ ගිවිසුම් (FTA) සහ කලාපීය වෙළෙඳ ගිවිසුම් (RTA) සඳහා අදාළ නෛතිකමය සම්බන්ධීකරණයට අවශ්‍ය මඟපෙන්වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වෙළෙඳ විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
2. ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන්, ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
4. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ඇති කිරීමට අදාළව සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
5. දේශීය පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය මිල පාලනයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික විධිවිධාන සැලැස්වීම.
6. දේශීය වෙළෙඳපළ තුළ ඇතිවන මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියාකිරීම.
7. ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය තුරන්කිරීම සඳහා වූ කාර්ය සාධක බලකායට පූර්ණ දායකත්වයක් ලබාදීම.
8. ලෝක වෙළෙඳපොළ තුළ නව අපනයන අවස්ථා හඳුනාගැනීමට මෙන්ම නව ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමේ අවස්ථා පිළිබඳ ගවේශණය කිරීමට ආයතන දිරිමත් කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.

1.4 සංවිධාන සටහන


ලේකම්
අතිරේක ලේකම් (පාලන)
අතිරේක ලේකම් (ආදායම් වෙළඳ)
අතිරේක ලේකම් (ආදායම් වෙළඳ)
අතිරේක ලේකම් (සංවර්ධන)
අධ්‍යක්ෂ (සැලසුම්)
ප්‍රධාන ගිණුම් නිලධාරී
ප්‍රධාන ආදායම් විගණක
ප්‍රධාන ඉංජිනේරු
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී
ගණකාධිකාරී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කා.සේ.සේ
රියදුරු
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
රියදුරු හා ත්‍රාන්සිලේටර් ත්‍රාක්ෂණික නිලධාරී
රියදුරු හා ත්‍රාන්සිලේටර් ත්‍රාක්ෂණික සහායක

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් මැනවින් ඉටු කරලීමට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු හතරකි.

- ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
- මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
- වාණිජ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය.

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා අරමුදල්

අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් මැනවින් ඉටු කරලීමට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතන හයකි.

- සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව.
- සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව.
- සීමාසහිත ලංකා සතොස සමාගම.
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය.
- අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය.
- මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල.

1.7 විදේශ අධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

විදේශ ආධාර ලබන ව්‍යාපෘති නොමැත.

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

1. ලංකා සතොස අලෙවිසැල් හා සමුපකාර අලෙවිසැල් ජාලය මඟින් ග්‍රාමීය මට්ටම දක්වා මහජනතාවට අවශ්‍ය පහසුකම්, එනම් කිසිදු භාණ්ඩ හිඟතාවයකින් තොරව මිලදී ගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීමට අවශ්‍ය සියලු විධිවිධාන සලස්වන ලදී.

2. 2021 වර්ෂය සඳහා "වෙළෙඳපොලේ පවතින මිලට වඩා අඩු මිලට අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සැපයීමේ වැඩසටහන" 2021.01.22 දින ආරම්භ කළ අතර එය 2021.12.31 දක්වා ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ, පුවත්පත් දැන්වීම් හරහා දේශීය නිෂ්පාදකයන්ගෙන් සහ සෘජු ආනයනකරුවන්ගේ අභිලාශ කැඳවා සුදුසුකම් ලත් සැපයුම්කරුවන් තෝරා ගැනීමේ කටයුතු කරන ලදී.

3. පාරිභෝගිකයන් වෙත සහන බඩු මල්ලක් ලබාදීමේ වැඩසටහන.
ලංකා සතොස හරහා සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය ඉලක්ක කර ගනිමින් රුපියල් 1000.00 වටිනාකමින් යුත් සහන බඩු මල්ලක් පාරිභෝගික ජනතාවට ලබා දීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන 2021.04.01 - 2021.04.19 දින දක්වා ක්‍රියාත්මක වූ අතර එහිදී රුපියල් මිලියන 180 ක වටිනාකමකින් යුත් සහන මලු අලෙවි කර අතර 2021.04.23 - 2021.05.13 දක්වා නව සහන මල්ලක් හඳුන්වා දෙන ලදී.මෙම වැඩසටහන 2021 වර්ෂය පුරාම ක්‍රියාත්මක වූ අතර 2022 වර්ෂයටද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

4. අපනයන සංවර්ධන අමාත්‍ය සභාව වසර 28කට පසු යළි සක්‍රිය කිරීමට 2021 වසරේදී හැකි විය. මෙය වෙළෙඳ අංශයට අදාළ තීරණ ගැනීම සැලකිල්ලට ගනිමින් ගරු ජනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් හා අග්‍රාමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් ආරම්භ කරන ලදී.

5. ඇඟළුම් පිළිබඳ උපදේශන සභාව, ආයුර්වේද සහ ඖෂධීය සහ රූපලාවන්‍ය පිළිබඳ උපදේශන සභාව, බෝට්ටු හා නැව් නිෂ්පාදන පිළිබඳ උපදේශන සභාව, ආදී වශයෙන් ක්ෂේත්‍ර 24ක් සඳහා අපනයන උපදේශන කමිටු පිහිටුවීමට 2021 වසරේදී හැකි විය.

6. නවදිල්ලි (ඉන්දියාව), ඩකා (බංගලාදේශය), කරච්චි (පකිස්ථාන්), වොෂින්ටන් ඩී.සී. (ඇමරිකාව), සිංගප්පූරුව, බ්‍රසල්ස් (බෙල්ජියම්), ලොස් ඇන්ජලීස් (ඇමරිකාව), බැංකොක් (තායිලන්තය), ස්ටොක් හෝම් (ස්වීඩනය), පැරිස් (ප්‍රංශය) යන තානාපති කාර්යාලවලට වාණිජ නිලධාරීන් පත් කිරීම සඳහා අදාළ කටයුතු සිදු කරන ලදී.

7. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සැකසීමට පියවර ගැනීම.
ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු සිදු කිරීමේ දී ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් නොමැති වීමේ අඩුපාඩුව හඳුනා ගැනීමත් සමඟ වෙළෙඳ අමාත්‍යවරයා විසින් 2021.08.21 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 20/1206/513/004 අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳව විද්වත් උපදේශක කමිටුවක් පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව නිසි වෙළෙඳ ප්‍රතිපත්තියක් නොමැති වීම තුළ රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් මෙරට නිෂ්පාදකයන් හා අපනයනකරුවන්හට සිදුව ඇති අලාභ හා එතුළින් මෙරටින් ගිලිහුණු වෙළෙඳ අවකාශයන් යළිත් මෙරටට හිමිකර ගැනීමට අවස්ථාව සැලසේ. ඒ අනුව විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් මෙම ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා සාමාජිකයින් 25 දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් පත් කර මේ වන විට ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වන වෙළෙඳ ප්‍රතිපත්ති රාමුව සකස් කර අවසන්ව ඇති අතර එහි භාෂා පරිවර්තන කටයුතු සහ අනෙකුත් අදාළ ආයතනය වෙතින් මේ පිළිබඳ අදහස් සහ යෝජනා ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත.

8. අපනයන නිෂ්පාදන ගම්මාන 1000 ක් පිහිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
   අපනයන විවිධාංගීකරණය තුළින් මෙරට අපනයන ආදායම වර්ධනය කරගැනීමේ අරමුණින්, අපනයන නිෂ්පාදන ගම්මාන දහසක් පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව, මෙරටට ආවේණික කෝපි ප්‍රභේදයක් වන ඇරබිකා කෝපි සඳහා වන ජාත්‍යන්තර වෙළෙඳපොළ හඳුනාගැනීමත් සමඟ, කෝපි ගම්මාන 16 ක් සඳහා අවශ්‍ය කෝපි පැළ සහ උපකරණ බෙදාදීමේ වැඩසටහනේ මූලික අදියර සඳහා අවශ්‍ය රු. මිලියන 12.64 මුදල් නිදහස් කරදීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. නුවරඑළිය දිස්ත්‍රික්කයේ හා හඟුරන්කෙත ප්‍රදේශයේ මෙම අපනයන නිෂ්පාදන ගම්මාන පිහිටුවා ඇත.

9. 24 වන ජනාධිපති අපනයන සම්මාන උළෙල සඳහා වන සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

10. විදේශ වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකා වෙළෙඳ නාම ගොඩනැගීම යටතේ ජාතික අපනයන සන්නාම සංවර්ධන වැඩසටහන සඳහා දේශීය අපනයනකරුවන් සමඟ ගිවිසුම් අත්සන් කිරීමේදී මූලික ගෙවීමක් ලෙස රු. මිලියන 20.5 ක මුදල් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

11. අපනයන වෙළෙඳපොළ වෙත පිවිසීමේ වැඩසටහන යටතේ ලියාපදිංචි නව සමාගම් වෙත අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීමට අදාළ කටයුතු සිදු කිරීම.

12. ශ්‍රී ලංකා ඕස්ට්‍රේලියා වෙළෙඳ හා ආයෝජන රාමුව ගිවිසුමට අදාළ සාකච්ඡාව සඳහා සම්බන්ධ වීම.

13. බෝට්ටු අංගන ලියාපදිංචි කිරීමේදී පිළිපැදිය යුතු නීතිමය අවශ්‍යතා අන්තර්ගත කොට නීතිමය රාමුවක් පිළියෙළ කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය, අපනයන සංවර්ධන මණ්ඩලය හා වෙළෙඳ අමාත්‍යාංශය එක්ව මූලික කටයුතු සම්පාදනය කිරීම.

14. ආනයනික අත්‍යාවශ්‍ය භාණ්ඩ වරායෙන් නිදහස් කර ගැනීම සඳහා ඇමරිකානු ඩොලර් ලබා ගැනීමට කටයුතු කිරීම.
   2021.09.24 වන දින ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණය පරිදි ආයතනික අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය වරාය පර්යන්ත වලින් නිදහස් කර ගැනීමට අවශ්‍ය වන ඩොලර් ලබා ගැනීමට අදාළව අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කරනු ලබන ආනයනික සංගමය ඇතුළු ආනයනකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් අදාළ ඇමරිකානු ඩොලර් ලබා ගැනීම සඳහා වන ඉල්ලීම් සිදුකර ඇති අතර එම කටයුතු සඳහා සම්බන්ධීකරණය කිරීම.

15. ඉදිරි විනිමය ගිවිසුම් තුළින් වෙළෙඳපොලේ තරගකාරීත්වයක් ඇති කරමින් අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වල මිල ස්ථාවර කිරීමේ වැඩසටහන.
   අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/2145/313/011- iii වූ ඉදිරි විනිමය ගිවිසුම් තුළින් වෙළෙඳපොලේ තරගකාරීත්වයක් ඇති කරමින් අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වල මිල ස්ථාවර කිරීමේ වැඩසටහන තව දුරටත් ක්‍රියාත්මක කිරීමට 2021.12.21 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම.

ප්‍රධාන ආයෝජන ව්‍යාපෘති

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, පාරිභෝගිකයින්, වෙළෙඳුන්, ගොවීන් සහ අපනයනකරුවන් වැනි වෙළෙඳ පාර්ශවකරුවන්ට වෙළෙඳ අමාත්‍යාංශයෙන් ප්‍රතිලාභ සලසනු ලැබේ.

	ප්‍රධාන ආයෝජන ව්‍යාපෘති	**ප්‍රතිපාදන (මිලියන)**	**මුළු වියදම (මිලියන)**
1	දක්ෂිණ සංවර්ධන මණ්ඩලය	50	48.9
2	සී/ස රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් මහා පරිමාණ ප්‍රදර්ශනාගාර පිහිටුවීම (රජවාස ඇතුලු)	204.5	116.3
3	ලක් සතොස අලෙවිසැල් පුළුල් කිරීම	200	161.2
4	තාරාපුරම් වැව සහ සමූපකාර ගම්මානය සංවර්ධනය කිරීම	45.5	13.1
5	සමුපකාර තොග වෙළඳ සංස්ථාව (ගබඩා අළුත්වැඩියාව සඳහා)	50	40.0
6	ලංකා සතොස හා සමුපකාර තොග වෙළඳ සංස්ථාව සහල් ආනයනය සඳහා ලබාගත් ණය වල භිගය මහජන බැංකුවට හා ලංකා බැංකුවට ගෙවීම.	4064	3898.1
7	ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සංවර්ධන ක්‍රියාකාරකම්.	300	87
8	ඒකාබද්ධ ඉඩම් රෙජිස්ටරයක් ඇති කිරීමේ වැඩසටහන	50	13.3
9	ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම.	50	40.6
10	ශ්‍රී ලාංකීක ව්‍යාපාර වලට ඉන්දිය හා චීන වෙළඳපොළට ඇතුලුවීමේ සහය දීම.	2	-
11	පෞද්ගලික අංශය මඟින් ටයර් පරීක්ෂා කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ පහසුකමක් පිහිටුවීමට පහසුකම් සැලසීම	50	50
12	එක්ස්පෝ 2020 ඩුබායි වැඩසටහන.	50	41.8
13	අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලයේ සංවර්ධන ක්‍රියාකාරකම්.	3	-
14	අපනයන වෙළඳපල ප්‍රවේශ ආධාර වැඩසටහන	35.5	34.1

මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - වෙළෙඳ අමාත්‍යාංශ

2.2 විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි ඉලක්ක

ජයග්‍රහණ

- නාගරික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා දේශීය පාරිභෝගික ජනතාවට ලංකා සතොස වෙළෙඳසැල් ජාලය සහ ආහාර දෙපාර්තමේන්තුව මඟින් සහන මිලට භාණ්ඩ සැපයීමට හැකි වීම
- ලංකා සතොස වෙළෙඳසැල් ජාලය තුළින් වාර්තාගත අලෙවියක් සිදුකිරීමට හැකි වීම.
- Q-shop හරහා වාර්තාගත භාණ්ඩ අලෙවියක් සිදුකිරීමට හැකි වීම.
- Respirone Nano AV99 මුහුණු ආවරණය වෙළෙඳපොළට හඳුන්වා දීම.
  පේරාදෙණිය විශ්ව විද්‍යාලය මඟින් ශ්‍රී ලාංකේය ඉතිහාසයේ පළමු වරට නිෂ්පාදනය කර ලොවට හඳුන්වා දෙන ලද 100% ක් වෛරස නැසීමේ හැකියාවෙන් යුත් ලොව ප්‍රථම මුහුණු ආවරණය වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාගේ මැදිහත් වීමෙන් යුතුව දේශීය වෙළෙඳපොළට හඳුන්වා දෙනු ලැබීම.
  දේශීය වෙළෙඳපොළක් සැකසීම සඳහා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව සමඟත්, ජාත්‍යන්තර වෙළෙඳපොළ අවකාශ සලසා ගැනීම සඳහා රට රටවල් වල ශ්‍රී ලාංකේය වෙළෙඳ කොමසාරිස්වරුන් හරහා එම රාජ්‍යයන් සමඟත් සාකච්ඡා කරමින් මෙම මුහුණු ආවරණය නිෂ්පාදනය කිරීමේ පේටන්ට් බලපත්‍රය හිමි පේරාදෙණිය විශ්ව විද්‍යාලයට, අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ වත්මන් රජයේ පූර්ණ සහයෝගය ලබාදීමට ද වෙළෙඳ අමාත්‍යතුමා මූලිකත්වය ගන්නා ලදී. එමෙන්ම කොවිඩ් 19 වසංගත තත්ත්වය ශ්‍රී ලංකාව තුළ පැතිර යාමත් සමඟ පැන නැගුණු අවශ්‍යතාවය මත ඊට පිළියමක් වශයෙන් සිදු කරන ලද නවෝත්පාදන පර්යේෂණයක් වශයෙන් පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින්, කාලීන අවශ්‍යතාවයක් සපුරා ලන අයුරින් නිෂ්පාදිත මෙම Respirone Nano AV99 මුහුණු ආවරණය මේ වන විට ජාත්‍යන්තර වෙළෙඳපොළට නිකුත් කිරීමේ කටයුතු සකස් කරමින් පවතී.

- දේශීයව නිෂ්පාදනය කළ ශල්‍ය මුහුණු ආවරණය SLS තත්ත්ව සහතිකය සහිතව අවම මිලකට වෙළෙඳපොළට නිකුත් කිරීමට මූලික වීම.

- ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනය මඟින් නිෂ්පාදිත නිසි ප්‍රමිතියෙන් යුත් විෂබීජ නාශක දියර පවත්නා වෙළෙඳපොළ මිලකට වඩා අඩු මිලකට පාරිභෝගිකයා වෙත ලබා දීම.

- සෞඛ්‍යයට හිතකර TFM (Total Fatty Matter) අගය සහිත සබන් දේශීයව නිෂ්පාදනය කිරීම හා අවම මිලගණන් යටතේ පාරිභෝගිකයාට ලංකා සතොස මඟින් අලෙවි කිරීමට පියවර ගැනීම.

අභියෝග.

- කොවිඩ් 19 ලෝක වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ වැඩසටහන් හා ව්‍යාපෘති වලට අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අපහසු විය.

- 2021 අග භාගය වන තෙක්ම අමාත්‍යාංශයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරින්ගේ තනතුරු කීපයක් පුරප්පාඩුව පැවතීම.

ඉදිරි ඉලක්ක

1. **දකුණු ආසියානු කලාපයේ විශාලතම කෘෂිද්‍රව්‍ය නිෂ්පාදන හුවමාරු කේන්ද්‍රය ශ්‍රී ලංකාවේ ඇති කිරීමට පියවර ගැනීම.**

   නැගෙනහිර-බටහිර නාවික වෙළෙඳ මාර්ගයේ විශේෂ ස්ථානයක් හිමි කරගන්නා ශ්‍රී ලංකාව පිහිටා තිබෙන වාසිදායක භූගෝලීය පිහිටීම අනුව ලංකාවේ නිෂ්පාදනය නොකෙරෙන හා ඕස්ට්‍රේලියාවේ නිෂ්පාදනය කෙරෙන පරිප්පු, බාර්ලි වැනි කෘෂිද්‍රව්‍ය සුවිශාල තොග වශයෙන් ලංකාවට ආනයනය කර, කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයට යාබදව ඉදි කෙරෙන කර්මාන්තශාලා, ගබඩා සංකීර්ණ හා බන්දිත ගුදම් මඟින් යළි සැකසුම් කොට අගය එකතු කොට ආසියානු, අප්‍රිකානු හා මැදපෙරදිග කලාපයේ රටවලට ප්‍රතිඅපනයනය කිරීම සඳහා සැලසුම් සකස් කර තිබේ.

   ජාත්‍යන්තර වෙළෙඳාම විෂයට අදාළව අන්තර්ජාතික වෙළෙඳ භාණ්ඩ හුවමාරු කිරීමේ මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීමේ සාකච්ඡා වට රාශියක් සඳහා විෂයභාර අමාත්‍යවරයා ලෙස සහභාගී වීමෙන් පසුව එහි මූලික පියවර වශයෙන් ඉන්දු-පැසිෆික් කලාපයේ විශාලතම කෘෂිකාර්මික නිෂ්පාදකයා වන ඕස්ට්‍රේලියානු ආයෝජන මත, පරිප්පු, බාර්ලි වැනි ඕස්ට්‍රේලියානු කෘෂිකාර්මික නිෂ්පාදන වෙනත් රටවලට ප්‍රතිඅපනයනය කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. මෙම මධ්‍යස්ථානය ඇති කිරීමෙන් පසුව දේශීය හා විදේශීය වශයෙන් ආයෝජන සහිත කර්මාන්තශාලා, තොග ගබඩා සහ රැකියා අවස්ථා හා විදේශ විනිමය උපයන මධ්‍යස්ථාන බිහි වීම තුළ දකුණු ආසියාවේ විශාලතම වෙළෙඳ භාණ්ඩ හුවමාරු කිරීමේ මධ්‍යස්ථානය බවට ශ්‍රී ලංකාව පත් වනු ඇත.

2. **අනුරාධපුර, මිහින්තලේ ආර්ථික මර්මස්ථාන නගරයක් ඇති කිරීමට සැලසුම් කිරීම.**

   භාණ්ඩ තොග රට පුරා බෙදාහැරීමේ යාන්ත්‍රණය තවදුරටත් කාර්යක්ෂම කිරීම සඳහා වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාගේ මැදිහත් වීම මත අනුරාධපුර මිහින්තලේ ආර්ථික මර්මස්ථාන නගරයක් ඇති කිරීමට සැලසුම් කර ඇත. 1993 වසරේ පැවති රජය විසින් උදාගම් නිර්මාණය කිරීම සඳහා අනුරාධපුර සිට මිහින්තලය දක්වා දුම්රිය මාර්ග ආදිය ඉදි කළ ද පුරා වසර 27ක් මුළුල්ලේ කිසිදු දියුණුවකින් තොරව මෙම සම්පත් ගරා වැටීමට ඉඩ හැර ඇති අතර, මේ හේතුවෙන් අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ අනුග්‍රහය හා උපදේශකත්වය මත අනුරාධපුරය, වවුනියාව, මඩකලපුව, කිලිනොච්චිය හා යාපනය ඇතුළු දිස්ත්‍රික්ක 10ක් සඳහා වූ ප්‍රධාන තොග හුවමාරු මධ්‍යස්ථානය බවට මෙම ස්ථානය පරිවර්තනය කිරීමට යෝජිතය.

   ඒ අනුව උතුර, උතුරු මැද හා නැගෙනහිර පළාත යන පළාත් තුනක් සඳහා වෙළෙඳ හුවමාරු මධ්‍යස්ථානයක් වශයෙන් මෙම ස්ථානය ක්‍රියාත්මක වන අතර, විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන භාණ්ඩ කොළඹ කොටුව දුම්රියපොළේ සිට සෘජුවම මෙම ස්ථානයට ගෙන ඒමේ හැකියාව ඇති වේ. මෙම ප්‍රදේශයන් ආශ්‍රිතව නිෂ්පාදනය කරන කෘෂිකාර්මික ද්‍රව්‍ය සියල්ල ද අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් තොරව, ගොවි ජනතාව විසින්ම දුම්රිය මඟින් හෝ වෙනයම් ක්‍රමවේදයකින් මෙම ආර්ථික මර්මස්ථානය වෙත රැගෙන ඒමේ පහසුකම ඉතාමත් කෙටි කාලයක් තුළ නිර්මාණය කිරීමට ද කටයුතු සම්පාදනය කෙරේ. කුමන හෝ හේතුවක් මත කොළඹ තොග වෙළෙඳ මධ්‍යස්ථානය වසා දැමීමකට ලක් වුවහොත්, පාරිභෝගික ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදා හැරීම කිසිදු ප්‍රමාදයකින් තොරව නිසි ලෙස සිදු කිරීමේ හැකියාව ඇති කිරීම මෙම නව තොග වෙළෙඳ මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම තුළින් අපේක්ෂිතය.

3. 2022 ජාතික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - ගෘහ ආර්ථික සුරක්ෂිතතා (සහන මල්ල) වැඩසටහන

2022 අයවැය යෝජනා මඟින් ක්‍රියාත්මක කරන ගෘහ ආර්ථික සුරක්ෂිතතා සහන මල්ල ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තරුණ කාන්තා ව්‍යාවසායකයන් තෝරා පත් කර ගැනීම සහ මෙම වැඩසටහනට අදාළව දිවයිනේ සෑම ග්‍රාම සේවා වසමකින්ම අඩු ආදායම්ලාභීන් තෝරා පත් කර ගෙන ඔවුන් වෙත මාසිකව රු. 2000.00 බැගින් ලබා දීම වෙනුවෙන් වෙළෙඳ අමාත්‍යාංශය වෙත රු. බිලියන 15 ක ප්‍රතිපාදන වෙන් කොට ඇත. මෙහිදී ප්‍රතිලාභීන් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් හරහා තෝරා ගෙන අමාත්‍යාංශය වෙත දැනුම් දීමට නියමිත අතර ඔවුන්ගේ දත්ත සැකසීම ඇතුළු කටයුතු සිදු කිරීම.

4. වතු කම්කරුවන් සඳහා සහනදායී මිලට තිරිඟු පිටි ලබා දීමේ වැඩසටහන

වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන වතු කම්කරු පවුල් සඳහා තිරිඟු පිටි සහනාධාරය ලබා දීමේ වැඩසටහන යටතේ එක් පවුලකට පිටි කිලෝ ග්‍රෑම් 15 ක් (එක් කිලෝවක් රු.20.00 බැගින් ලබා දීමට තීරණය වී ඇත.

අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මේ සඳහා රජයේ දායකත්ව මුදල දැරිය යුත්තේ වෙළෙඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ගෘහ ආර්ථික සුරක්ෂිතතා (සහන මල්ල) වැඩසටහන මඟිනි.

5. අත්‍යාවශ්‍ය භාණ්ඩ වරාය පර්යන්තවලින් නිදහස් කර ගැනීමට අවශ්‍ය වන ඇමරිකානු ඩොලර් ලබා ගැනීමට අදළව අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනික සංගමය ඇතුළු ආනයනකරුවන්ට ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් අදාළ ඇමරිකානු ඩොලර් ලබා ගැනීම සම්බන්ධීකරණ කිරීම.

6. ඉදිරි විනිමය ගිවිසුම් තුළින් වෙළෙඳපොලේ තරඟකාරීත්වයක් ඇති කරමින් අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වල මිල ස්ථාවර කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

ජේ. එම්. භද්‍රානි ජයවර්ධන
ලේකම්
වෙළෙඳ අමාත්‍යාංශය

(ආයතන ප්‍රධානියාගේ අත්සන)

ජේ. එම්. භද්‍රානි ජයවර්ධන
ලේකම්
වෙළෙඳ අමාත්‍යාංශය
අංක.492, ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

03. පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		4,863,029,004	2,161,544,589	ඒසීඒ-3
-	තැන්පතු		9,567,586	377,764	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		7,256,343	7,848,443	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	596,652	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		4,879,852,934	2,170,367,448	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		4,879,852,934	2,170,367,448	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		60,401	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		4,879,792,533	2,170,367,448	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
184,542,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	184,173,938	176,079,992	
202,549,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	201,761,003	91,784,684	ඒසීඒ-2(ii)
470,639,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	423,923,602	320,610,393	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
857,730,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		809,858,543	588,475,069	
	මූලධන වියදම්				
76,400,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	57,975,969	53,678,575	
29,350,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	29,335,063	3,402,278	
803,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	426,679,806	229,608,880	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
350,000	හැකියා වර්ධනය	14	348,183	-	
4,302,000,000	වෙනත් මූලධන වියදම්	15	4,078,419,811	1,938,967,205	
5,211,100,000	මුළු මූලධන වියදම් (උ)		4,592,758,832	2,225,656,938	
	තැන්පතු ගෙවීම්		471,915	31,975	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		5,387,449	27,388,673	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		5,859,363	27,420,648	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		5,408,476,738	2,841,552,655	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(528,684,206)	(671,185,207)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(528,684,206)	-	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		ඒසීඒ-3
			(528,684,206)	-	

මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - වෙළෙඳ අමාත්‍යාංශය

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	112,636,540	3,400,978
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	17,671,336	19,540,230
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**130,307,876**	**22,941,208**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,229,876	19,194,441
දේපළ පිරියත හා උපකරණ සංචිතය		112,636,540	3,400,978
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසිඒ-4	9,441,460	345,789
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		
මුළු වගකීම්		**130,307,876**	**22,941,208**

මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - වෙළෙඳ අමාත්‍යාංශ

පිටු අංක 7 සිට 26 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 27 සිට 33 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර : ලේකම්	තනතුර :	නම :
දිනය : 2022. 02. 21	දිනය :	දිනය :
ජේ. එම්. හදානි ජයවර්ධන වෙළෙඳ අමාත්‍යාංශය අංක.492, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03.		අර්වින්දි ද සිල්වා ප්‍රධාන මූල්‍ය නිලධාරි වෙළෙඳ අමාත්‍යාංශය අංක.492, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සි

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කක්‍ය	
	2021 රු.	නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	652,910
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	5,666,126	-
අග්‍රිම ලැබීම්	4,863,029,004	2,161,544,589
අත්තිකාරම් අයකර ගැනීම්	2,050,657	-
තැන්පතු ලැබීම්	9,567,586	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**4,880,313,374**	**2,162,197,499**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	287,849,018	79,254,447
සහනාධාර සහ මාරුකිරීම්	141,590	84,237
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	203,658,472	18,771,610
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	60,401	-
අත්තිකාරම් ගෙවීම්	2,465,919	1,408,454
තැන්පතු ගෙවීම්	471,915	31,975
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**494,647,315**	**99,550,723**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**4,385,666,059**	**2,062,646,776**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	487,489,948	298,792,186
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**487,489,948**	**298,792,186**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(487,489,948)**	**(298,792,186)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**3,898,176,111**	**1,763,854,590**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	3,898,176,111	1,763,854,590
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**3,898,176,111**	**1,763,854,590**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(3,898,176,111)**	**(1,763,854,590)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - වෙළෙඳ අමාත්‍යාංශය

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් එකතු කිරීම අදාළ නොවේ.

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම (රු.මිලියන)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන (රු.මිලියන)	අවසාන ප්‍රතිපාදන (රු.මිලියන)		
පුනරාවර්තන	702.80	857.731	809.85	**94.4%**
ප්‍රාග්ධන	4,116.10	5,211.10	4,592.75	**88.1%**

3.7 මු.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

නොමැත.

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.මිලියන

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2020** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2020**දි නට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදි ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ-අරමුදල	36.58	36.58	-	100%
9152	යන්ත්‍රෝපකරණ-ශීර්ෂය	-	-	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

*භාණ්ඩ වට්ටෝරු ලේඛනය අනුව ශේෂය ඉදිරිපත් කර ඇත.

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } වීඒසි/බී/එම්ටී/2/21/11 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2022මැයි 31 දින

ලේකම්
වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

මෙමෙ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම් උසස් මට්ටමේ

සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූප වී නොතිබුණි.

(i) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.2 වගන්තිය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ,වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් නොකර අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුළ ගැළපීම් කර තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ii) අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් සහ තැන්පතු ලැබීම් හා ගෙවීම් ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය හා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

---.

1.6.1.1 පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 116-01-02-1202 වැය විෂයට හර කල යුතු ඉන්ධන වියදම් රු.351,407ක් , 116-01-02-1409 වැය විෂයට රු.221,887ක් හා 116-1-2-1205 වැය විෂයට රු.129,500ක් වශයෙන් හර කර තිබුණි. ඒ අනුව එම ප්‍රමාණයෙන් ඉන්ධන වියදම අඩුවෙන් හා වෙනත් වියදම් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) 116-01-02-1301 වාහන අළුත්වැඩියා වියදම් යටතේ ගිණුම්ගත කළ යුතු රු.259,938 ක වියදම් 116-01-02-1409 වාහන නඩත්තු වියදම් යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වාහන නඩත්තු වියදම් වැඩියෙන් හා වාහන අළුත්වැඩියා වියදම් අඩුවෙන්. මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ .මෝටර් වාහන වල පිරිවැය වශයෙන් රු. 79,900,500 ක් දක්වා තිබුණද , විගනණය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව රු.80,400,000 ක් වූයෙන් රු. 499,500 ක වෙනසක් නිරීක්ෂණය විය

1.6.2.2 මූල්‍ය වත්කම්

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ ශේෂය 17,671,336 ක් වුවත් අත්තිකාරම් බී ගිණුමේ කේවල ශේෂ ලැයිස්තුව අනුව ශේෂය රු.17,767,595ක් විය. ඒ අනුව රු.96,259 ක් වැඩියෙන් කේවල ශේෂ ලැයිස්තුවේ දක්වා තිබුණි.

1.6.2.3 තැන්පතු ගිණුම් ශේෂ

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කල යුතු රු.1,752,813 ක්, සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කලයුතු රු. 396,041 ක් සහ සේවක භාරකාර අරමුදලට ප්‍රේෂණය කලයුතු රු 11,088 ක් අදාල ආයතන වෙත ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු රු. 4,900,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැඩ සටහන් 01 හි වැය විෂයයන් 06 ක් සඳහා රු. 43,000,000 ක් සහ වැඩ සටහන් 02 හි වැය විෂයයක් සඳහා රු. 1,050,000,000 ක් වශයෙන් රු. 1,093,000,000 ක් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. එය එක් එක් වැය විෂයයේ ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 33 සිට සියයට 223 දක්වා වූ පරාසයක පැවතුණි.

(ඇ) වැය ශීර්ෂය යටතේ වැඩසටහන් 01 හි වැය විෂයයන් 10 ක් සඳහා රු. 15,610,300 ක් වීරමොං පරිපාටිය යටතේ අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. එය එක් එක් වැය විෂයයේ ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 33 සිට සියයට 258 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඈ) 2021 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් 116-2-5-3-2202 වැය විෂයය සඳහා ප්‍රතිපාදන වෙන් කර ගෙන නොතිබුණු අතර ඒ සඳහා 116-2-5-1-2202 වැය විෂයයෙන් මු.රෙ 66/69 මාරුකිරීම යටතේ රු.45,500,000 ක් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

(ඉ) පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන විශේෂයෙන් සඳහන් කල කාර්යයන්ට හැර වෙනත් අරමුණු සඳහා නොයෙදවිය යුතු අතර මු.රෙ. 66/69 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු නොකල යුතු වුවද ඊට පටහැනිව 116-1-2-0-1003 වැය විෂයය සඳහා රු.4,250,000 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන ඉන් රු.2,238,500ක් මු.රෙ.66 මාරු කිරීම මඟින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැදීම් සහ බැරකම් නොමැති බව සඳහන් කර තිබුණද , 2022 වර්ෂයේ ගෙවීම් සම්බන්ධ නියැදි පරීක්ෂාවේදී 2021 වර්ෂයට අදාල රු. 3,481,619 ක බැරකම් 2022 වර්ෂයේදී නිරවුල් කර තිබුණි.

(ආ) 116 – 01 – 02 – 1409 , 116 – 01 – 02 – 1301, 116 – 01 – 02 – 1404, 116 – 01 – 02 – 2102 116 – 01 – 02 – 1409 වැය විෂයන් යටතේ ඉතිරිය ඉක්ම වූ බැරකම් රු. 3,212,273 ක් පැවති අතර මේ සම්බන්ධයෙන් මු.රෙ 94 ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

(ඇ) 2021 වර්ෂයේ ලී බඩු උපකරණ මිළදී ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවිය යුතු රු.2,018,780 ක මුදල 2022 පෙබරවාරි 28 දින වන විටත් ගෙවා නොතිබුණු අතර එය බැරකම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යාල වක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යවරයාගේ සහ අමාත්‍යවරයාගේ සහය කාර්ය මණ්ඩල වෙනුවෙන් භාවිතා කල හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව 08ක් වුවද අමාත්‍යාංශය විසින් ඒ සඳහා නිල වාහන 11 ක් යොදවා තිබුණි.

2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

මූල්‍ය ප්‍රකාශනයේ සටහන (viii) හි 2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් වක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස් වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම පිළිබඳ 2021.12.31 දිනට තත්ත්ව වාර්තාවේ, අමාත්‍යාංශයට අදාල බැංකු ගිණුම් පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

අමාත්‍යාංශයේ අරමුණු අතුරින් පහත දැක්වෙන ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(i) ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් තුළින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරැකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තිරුබදු

ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම.

(ii) අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාල දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

2008 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො.100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම ප්‍රධාන කාර්යයන් ලෙස හඳුනාගෙන තිබුණ ද පසුගිය වර්ෂයන් තුළ දෙපාර්තමේන්තුව විසින් සහල් සංචිතයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. 2021 වර්ෂයේදී දකුණු ආසියානික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ අවශ්‍යතාවය මත ශ්‍රී ලංකාව තුල සහල් මෙට්‍රික් ටොන් 8000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම සඳහා රු.මිලියන 200 ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත සපයා තිබුණි.කෙසේ වෙතත් 2021 ඔක්තොබර් මාසය දක්වාත් ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම සඳහා මෙම ප්‍රතිපාදනය උපයෝගී කර නොගැනීම හේතුවෙන් මෙම ප්‍රතිපාදනය රාජ්‍ය වාණිජ (විවිධ) නිතිගත සංස්ථාව වෙත මාරු කර තිබුණි. මෙම කාර්යය 2021 වර්ෂයේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඉටුකර ගැනීම සඳහා සැලසුම් කල කාර්යයක් වුවද රටතුල සහල් සංචිතයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

සංස්ථාවට අයත් ගබඩා 13 ක් නවීකරණය කිරීම සඳහා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව විසින් රු.82,525,681 ක් වැය කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.62,490,367 ක වියදම් ප්‍රතිපූරණය කර තිබුණි.

මෙම සියළුම ගබඩා නවීකරණය කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය 2019 වසරේ සිදුකර තිබුණු අතර කොන්ත්‍රාත් කාළය දින 30 සිට දින 180 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.කෙසේ වුවද 2022 අප්‍රේල් 30 දින වන විටත් ගබඩා 06 ක නවීකරණ කටයුතු අවසන් වී තිබුණු අතර අනෙකුත් ගබඩා 07හි නවීකරණ කටයුතු වල ප්‍රගතිය 05% සිට 95% දක්වා වී තිබුණි

ප්‍රතිපාදන ලබා දී වසරකට අධික කාලයක් ගත වන තුරුත් මෙම ගබඩා නවීකරණ කටයුතු අවසන් නොකිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අධීක්ෂණ කාර්යය සිදුවී නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය තුල කාර්යාල උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මේ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර සකස්කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව වහාම ලබාගතහැකි වටිනාකමින් අඩු භාණ්ඩ මිලදී ගැනීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රමය සඳහා වෙළෙඳපොල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කල යුතු වුවත් අමාත්‍යාංශය විසින් මිලියන 03 ඉක්ම වූ ඉහත මිලදී ගැනීම සඳහා වෙළෙඳපොල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කර තිබුණි.

(iv) දෙවන අදියරේ කාර්යාල උපකරණ මිලදී ගැනීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා තිබුණු අතර රු.4,380,559ක කාර්යාල උපකරණ මිලදීගත් ආයතනය අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවීය.

(v) ශ්‍රවණාගාරය සඳහා පුටු මිලදී ගැනීමට ලංසු කැඳවා නොතිබුණු අතර ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සැපයුම්කරුවෙකු නිර්දේශ කර තිබුණි.මේ සඳහා රු.3,289,500ක් වැය වී තිබුණු අතර මෙය ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව කල මිලදී ගැනීමක් බව නිරීක්ෂණය විය.

(ආ) අමාත්‍යාංශ කාර්යාලයෙහි අභ්‍යන්තර නිර්මාණකරණය හා කාර්යාල වෙන් කිරීම් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 116-1-2-0-2001 යටතේ උක්ත කාරණය ඉටුකර ගැනීම සඳහා රු.22,000,000 ක් පමණක් ප්‍රතිපාදනය කර තිබුණද අමාත්‍යාංශය විසින් එම සීමාව ඉක්මවා රු.35,032,625 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (අ) ප්‍රකාරව දැන්වීම් පළ කිරීම ආර්ථික වශයෙන් අවාසි සහගත වන අඩු වටිනාකමකින් යුතු අයිතමයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා හෝ නිතර භාවිතා කරනු ලබන අයිතමයන් මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම අදාල කරගත යුතු වුවද මිලියන 35 ඉක්ම වූ ඉහත කාර්යය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා නිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.16 (අ) ප්‍රකාරව ලංසුකරුවන්ට විකල්ප ලංසු ඉදිරිපත් කිරීමට අවසර දෙන්නේ නම් ඒ බව ලංසු ලේඛන වල පැහැදිලිව සඳහන් කල යුතු වුවත් ලංසු කැඳවීමේ ලේඛන වල ඒ බව සඳහන් කර නොතිබියදී ආයතන 02 ක් විකල්ප ලංසු ඉදිරිපත් කර තිබුණි. ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද මෙම විකල්ප ලංසුවක් , ලංසු ඇගයීම් කාර්යය සඳහා සලකා බලනු නොලැබියයුතු වුවත් එක් පෞද්ගලික ආයතනයක් ඉදිරිපත් කර තිබූ විකල්ප ලංසුව ඇගයීමේ කාර්යයේදී සළකා බලා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

මෙම විකල්ප ලංසුව ඉදිරිපත් කල ආයතනයට වඩා අඩු වටිනාකමකින් යුතු ලංසු ඉදිරිපත් කල ආයතන 03ක් තිබියදී ඉහත ආයතනයෙන් ඉදිරිපත් කල රු.14,019,655ක් වූ විකල්ප ලංසුව මත එම ආයතනයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.16 (ආ) ප්‍රකාරව විකල්ප ලංසුවක් ලංසු සුරක්ෂණයක් මගින් සනාථ කළ යුතු වුවත් ඇස්තමේන්තුව සමඟ 60% ක විචලනයක් සහිත මෙම ලංසුව වෙනුවෙන් එවැනි ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණු අතර කොන්ත්‍රාත් වටිනාකම මත 5% ක කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

(අ) 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 හි 02(i) ඡේදය ප්‍රකාරව ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත, තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතුය. කෙසේ වුවද, අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන වාහන 24 න් වෙනත් රජයේ ආයතන නමින් ලියාපදිංචි කර තිබුණු වාහන 18 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ජනාධිපති ලේකම් කාර්යාලය නමින් ලියාපදිංචි කර ඇති Land Rover Discovery වර්ගයේ ජීප් රථයක් අමාත්‍යාංශය ආරම්භයේ සිට නිශ්කාර්යව ගාල් කර පැවතුනි.කොළඹ මහනගර සභාවේ කාර්මික ඉංජිනේරු විසින් එවකට පැවති අභ්‍යන්තර වෙළෙඳ ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2020 මාර්තු 07 දින වාහනයේ පවතින දෝෂ සහ අලුත්වැඩියා කිරීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද , අමාත්‍යාංශය විසින් 2021. දෙසැම්බර් 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4 අනාර්ථික ගනුදෙනු

අමාත්‍යාංශයේ 2020 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පිටපත් 350 කින් මුද්‍රණය කර තිබුණු අතර ඒ වෙනුවෙන් දරන ලද පිරිවැය රු.791,910 ක් වී තිබුණි.මෙම වාර්තාවේ ඇතුළත්විය යුතු 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ,භාණ්ඩ සමීක්ෂණ වාර්තාව , විගණකාධිපති වාර්තාව වැනි මූලිකාංග ඇතුළත් නොවීමත්, පිටු 831 කින් යුක්ත වාර්තාවේ විශාලත්වය වැඩිවීමත් හේතුවෙන් පාර්ලිමේන්තුව විසින් එම පිටපත් ප්‍රතික්ෂේප කර තිබුණෙන් ඒ සඳහා දරන ලද පිරිවැය අනාර්ථික වැය දැරීමක් වී තිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 මැයි මස 07 වන දිනැති අමප/20/0722/218/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහිතව ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කාරක ප්‍රාග්ධනය ලබා දෙමින්, ඔවුන්ට නැවතත් වී මෝල් ක්‍රියාත්මක කරවා විකිණීම සඳහා සතොස ආයතනය වෙත හෝ අරක්ෂිත තොගයක් ලෙස පවත්වා ගෙන යාම සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත සහල් ලබා දීමට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 2020 වර්ෂයේ සුළු හා මධ්‍ය පරිමාන සහල් මෝල් හිමියන් වෙත කඩිනමින් ණය සහන ලබා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සහල් මෝල් හිමි සමූපකාර සමිති සඳහා ප්‍රමුඛතාවය ලබා දීම , 2020 ජනවාරි මාසයේ ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ලබා දුන් සහන පැකේජය තුලින් ණය පහසුකම් ලබා නොගත් මෝල් හිමියෙකු වීම සහ බැංකු වෙත ණය වාරික ගෙවීම් පැහැර හැර නොමැති වීම් යන නිර්ණායක වලට යටත්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි.

(i) මෙම ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂය තුල රු.මිලියන 266.7 ක සහ 2021 වර්ෂය තුල රු.මිලියන 109 ක ණය පහසුකම් ලබා දී තිබුණි. මෙම ණය ලබාදීමේදී එක් එක් සහල් මෝල් හිමියන්ගෙන් අයවිය යුතු ණය සම්බන්ධයෙන් අවධානය යොමු වී නොතිබුණු අතර එක් එක් සමූපකාර සමිති වල සියළු සාමාජිකයින් ලබා ගත් බැංකු ණය වලින් නොගෙවූ මුළු ණය ප්‍රමාණය හා ගෙවිය යුතු මාසික වාරිකය පදනම් කරගෙන එක් එක් සමිතිය සඳහා ව්‍යාපෘතිය යටතේ ලබා දිය යුතු ණය ප්‍රමාණය තීරණය කර තිබුණි. ණය ලබාදිය යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් පවතින ගැටළු හේතුවෙන් අගතියට පත් පාර්ශව විසින් අධිකරණ ක්‍රියාමාර්ගවලට යොමු වී තිබුණු අවස්ථාද නිරීක්ෂණය විය. මේ අනුව ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් 3 වන නිර්ණායකයට පටහැනිව ණය ලබා දී තිබුණු අතර එම තත්වයන් වළක්වා ගැනීම සඳහා අමාත්‍යාංශයේ අවධානය යොමුවී නොතිබුණි.

(ii) 2020 වර්ෂයේදී පුත්තලම දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය සඳහා රු.10,000,000ක ණය මුදලක් ලබා දීමට සමූපකාර කොමසාරිස්වරයා නිර්දේශ කර තිබුණද ඒ වෙනුවෙන් රු.70,000,000 ක් ලබාදී තිබුණි. ඒ අනුව සමූපකාර සමිති සඳහා ණය ලබා දීමේදී සමූපකාර කොමසාරිස්වරයාගේ නිර්දේශය ඉක්මවා ණය ලබා දී තිබුණු අතර මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අධීක්ෂණ කාර්යය සිදුවී නොතිබුණි.

(ආ) දේශීය ව්‍යවසායකයන් බිහිකිරීම හා සවිබල ගැන්වීම ප්‍රධාන අරමුණුකර ගනිමින් රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් රාජ්‍ය වගකීමක් සහිතව දැරිය හැකි මුදලකට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු දේශීය නිෂ්පාදන බෙදාහැරීමේ අරමුණින් කුඩා අලෙවිසැල් ජාලයක් දිවයින පුරා ස්ථාපිත කිරීම සඳහා Q Shop සංකල්පය 2020 වර්ෂයේදී හඳුන්වා දෙන ලදී. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2021 වර්ෂය අවසන් වන විට Q Shop වෙළෙඳසැල් 20 ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණි. අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය තුල මේ වෙනුවෙන් රු.34,319,291 ක මුදලක්

ප්‍රතිපූරණය කර තිබුණි. කෙසේ වුවද, 2022 මාර්තු 28 දින වන විට වෙළෙඳසැල් 08 ක් පමණක් ස්ථාපිත කර තිබුණි.

(ii) මෙම අලෙවිසැල් බහලුම් පෙට්ටි නවීකරණය කර ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් බහලුම් පෙට්ටි 20 ක් සඳහා කරන ලද ආයෝජන මුදල වශයෙන් අමාත්‍යාංශය විසින් 2021 ජනවාරි 26 දින රු.7,200,000 ක් නිදහස් කර තිබුණි.කෙසේ වෙතත් වෙළෙඳසැල් 07 ක් පමණක් ස්ථාපිත කර තිබුණු අතර එම බහාලුම් ප්‍රමාණය මිලදී ගත් බවට නහවුරු කර ගැනීම හෝ එම මුදල වියදම් කළ ආකාරය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පසු විපරම් කර නොතිබුණි.

(iii) අලෙවිසැල් 20 ඉදිකිරීම් සඳහා මධ්‍යම උපදේශන ඉංජිනේරුමය කාර්යාංශය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණ අතර සංස්ථාව විසින් එම ආයතනය සමඟ ලිඛිත ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි. වියදම් ප්‍රතිපූරණය කිරීමේදී මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමු වී නොතිබුණි.

(iv) අමප/20/1909/313/035 හා 2020 දෙසැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2021 වර්ෂය තුල Q- shop 20 ක් රු.50,000,000 ක ඇස්තමේනතුවක් යටතේ ඉදිකිරීමට නියමිතව තිබුණි. කැබිනට් මණ්ඩල තීරණය අනුව එක් අලෙවිසැලකට ඇස්තමේන්තුගත පිරිවැය රු.2,500,000 ක් වුවද එම මුදල ඉක්මවා අලෙවිසැල් 5 ක් ඉදි කර තිබූ අතර ඒ සඳහා දරන ලද අමතර පිරිවැය රු.10,872,604 ක් වී තිබුණි.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

තිරසාර ආර්ථික වර්ධනයක් ඇතිකිරීම තුළින් සහ සහනදායී මිල ක්‍රමයක් තුළින් දරිද්‍රතාව අවම කිරීමේ අරමුණින්, දේශීය නිෂ්පාදකයන් සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා වූ "Q shop" වෙළෙඳසැල් ජාලය ස්ථාපිත කිරීමට අදාල මූලික කටයුතු සිදු කිරීම වෙළෙඳපොළ භාණ්ඩ හිඟය හා මිල අස්ථාවර වීම වළක්වා ගැනීම තුළින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා "රජවාස" ව්‍යාපෘතිය යටතේ සාප්පු සංකීර්ණ ජාලයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මහපෙන්වීම හා කටයුතු අධීක්ෂණය යන තිරසර සංවර්ධන ඉලක්කයන් ඉටු කර ගැනීමේ ප්‍රගතිය සියයට 50 ට අඩු මට්ටමක පැවතුණි

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	2021 දෙසැම්බර් 31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව	අතිරික්ත/ (පුරප්පාඩු) සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	25	18	(07)
තෘතියික මට්ටම	08	02	(06)
ද්විතියික මට්ටම	55+174*	24+276*	(31)+102*
ප්‍රාථමික මට්ටම	23	19	(4)
අනියම් / කොන්ත්‍රාත් මට්ටම	04	04	-
එකතුව	115+174*	67+276*	48+102*

*ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට අනුයුක්ත කර ඇත.

නිරීක්ෂණ

(අ) 2021 දෙසැම්බර් 31 වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 07 ක් පැවති අතර අමාත්‍යාංශයට අනුයුක්ත ද්විතියික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය 55 ක් වුවද තථ්‍ය කාර්යමණ්ඩලය 24 ක් වීම හේතුවෙන් තනතුරු 31 ක් පුරප්පාඩුව පැවතුනි.

(ආ) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලය 174 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 276 ක් වීමෙන් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 102 ක අතිරික්තයක් පැවතුනි.

බී.ජී.අයි. නිරංජා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
2021 වර්ෂය සඳහා "වෙළෙඳපොලේ පවතින මිලට වඩා අඩු මිලට අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සැපයීමේ වැඩසටහන යටතේ, පුවත්පත් දැන්වීම් හරහා දේශීය නිෂ්පාදකයන්ගෙන් සහ සෘජු ආනයනකරුවන්ගෙන් කැඳවූ අභිලාශ		✓	
සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය ඉලක්ක කර ගනිමින් රුපියල් 1000.00 වටිනා කමින් යුත් බඩු මල්ලක් පාරිභෝගික ජනතාවට ලබා දීමට කටයුතු කිරීමේ වැඩසටහන යටතේ 2021.04.01 - 2021.04.19 දින දක්වා අලෙවි කර ඇති .සහන බඩු මලු ප්‍රමාණය හා එහි මුල්‍යමය වටිනාකම. තවදුරටත් මෙම වැඩසටහන 2021.05.13 දක්වා මෙහෙයවා ඇති අතර 2021 වසරේ අවසානය දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.	✓		
2020 වර්ෂයේ අගෝස්තු මස ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස්කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවීමෙන් පසු විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් මෙම ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා සාමාජිකයින් 25 දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් පත් කර ජාතික වෙළෙඳ ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම හා එම ප්‍රතිපත්ති රාමුව භාෂා පරිවර්තන කටයුතු වලට භාරදී ඇති අතර අදාළ අනෙකුත් ආයතනය වෙතින් අදහස් හා යෝජනා ලබා ගැනීමට ඉල්ලුම් කර ඇත.	✓		

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50-74	75-100
ඉලක්කය (1) තිරසාර ආර්ථික වර්ධනයක් ඇතිකිරීම තුළින් සහ සහනදායී මිල ක්‍රමයක් තුළින් දරිද්‍රතාව අවම කිරීමේ වැඩසටහන් අධීක්ෂණය කිරීම.	දේශීය නිෂ්පාදකයින් සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම වෙළෙඳපොළ භාණ්ඩ හිඟය හා මිල අස්ථාවර වීම වළක්වා ගැනීම තුළින් පාර්භෝගිකයා ආරක්ෂා කිරීම.	"Q Shop" වෙළෙඳසැල් ජාලය ස්ථාපිත කිරීමට අදාළ මූලික කටයුතු සිදුකිරීම. "රජවාසල" ව්‍යාපෘතිය යටතේ සාප්පු සංකීර්ණ ජාලයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මහපෙන්වීම හා කටයුතු අධීක්ෂණය.	✓ ✓		
ඉලක්කය (2) ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර සංචිත පවත්වා ගැනීම අධීක්ෂණය කිරීම.	ආහාර මිල උච්ඡාවචනය වැළැක්වීම. ආහාර ආරක්ෂිත සංචිත පවත්වාගෙන ගැනීම.	එළවළු හා පළතුරු ගබඩාකර කල්තබා ගැනීමේ ශීතාගාර ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම. සහල් ආරක්ෂිත සංචිත තොග පවත්වාගැනීම සඳහා විද්‍යාත්මක ගබඩාවක් ඉදිකිරීම.		✓	✓
	දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම.	ලංකා සතොස අලෙවිසැල් අලෙවිසැල් ජාලය පුළුල් කිරීම හා ඒ ආශ්‍රිතව පාරිභෝගික ප්‍රජාවට සහන මිල ගණන් යටතේ අත්‍යාවශ්‍ය ආහාර ලබා ගැනීමට හැකි වීම. හා විශේෂයෙන් සහන මල්ල ක්‍රියාත්මක කිරීම. ඉදිරි විනිමය ගිවිසුම් තුළින් වෙළෙඳපොලේ තරඟකාරීත්වයක් ඇති කරමින් අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වල මිල ස්ථාවර කිරීමේ වැඩසටහන. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/2145/313/011- iii වූ ඉදිරි විනිමය ගිවිසුම් තුළින් වෙළෙඳපොලේ තරඟකාරීත්වයක් ඇති කරමින් අත්‍යාවශ්‍ය		✓	

		පාරිභෝගික භාණ්ඩ වල මිල ස්ථාවර කිරීමේ වැඩසටහන තව දුරටත් ක්‍රියාත්මක කිරීමට 2021.12.21 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම.			

5.2 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

1. සහනදායී මිල ක්‍රමයක් තුළින් පාරිභෝගිකයන්ට සහන සැලසීමට මේ වන විටත් හැකි වී ඇත.
2. ස්ථාවර මිලක් යටතේ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල අස්ථාවරවීම වළක්වා ගැනීමට මේ වන විටත් කටයුතු කෙරේ.
3. ආරක්ෂිත සහල් තොග පවත්වා ගෙන යාම හා එළවළු පළතුරු ගබඩා සංකීර්ණ ඉදිකිරීම තුළින් ආහාර හිඟයකින් තොරව ජනතාවට සැපයීමට කටයුතු කර ඇත.
4. අපනයන ඉහළ නැංවීම සඳහා මේ වනවිටත් වැඩසටහන් බොහොමයක් සැලසුම් කර ඇත.
5. STC ආයතනයේ ආනයන ක්‍රියාදාමය තුළ ප්‍රමුඛතාවය ගෙන කටයුතු කිරීම හා මනා බෙදාහැරීම් ජාලයක් ක්‍රියාත්මක කිරීම.
6. කූට වෙළෙඳුන් විසින් සහවා තිබූ සීනි තොග අත්‍යාවශ්‍ය ආහාර කොමසාරිස් ජනරාල් භාරයට ගෙන වෙළෙඳ අමාත්‍යාංශය හා ආහාර දෙපාර්තමේන්තුව මැදිහත්ව බෙදා හැරීම් කටයුතු සංවිධානය කරන ලදී. එහිදී ලංකා සතොස, සමූපකාර සමිති හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ ලියාපදිංචි තොග වෙළෙඳුන් හරහා බෙදා හැරීම් සිදු කරන ලදී.

අභියෝග

1. කොවිඩ් 19 ලෝක වසංගත තත්ත්වයේ බලපෑම හේතුවෙන් දේශීය හා විදේශීය වෙළඳ කටයුතුවලට බාධා එල්ලවීම නිසා අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට 2021 වසරේදී අපහසු විය.
2. අමාත්‍යාංශයේ සේවක පුරප්පාඩු බොහොමයක් සඳහා නවක උපාධිධාරීන් බඳවාගත් අතර ඔවුන් පුහුණු කරමින් අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු කිරීමට සිදුවීම නිසා අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම අභියෝගයක් විය.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	25	18	07
තෘතියික	08	02	06
ද්විතීයික	55+174*	24+276*	31+102*
ප්‍රාථමික	23	19	04
තාවකාලික	04	04	0
එකතුව	**115+174***	**67+276***	**48+102**

* ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් නිහය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

ඉහත සටහනට අනුව වෙළෙඳ අමාත්‍යාංශයේ තනතුරු බොහොමයක් පුරප්පාඩු වී තිබීම ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීමේදී පුහුණු ශ්‍රමය නොමැතිකම අභියෝගයක්ව ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

2021 වර්ෂය තුළ කොවිඩ් වැළැක්වීම් මාර්ගෝපදේශ තුළ පුහුණු උපාධිධාරීන් සම්බන්ධ කර ගැනීමේ කටයුතු කරමින් තවත් උපාධිධාරී අභ්‍යාසලාභීන්ට නිරන්තර පුහුණුව ලබා දෙන ලදී.

	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වාභාවය (දේශීය / විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	වෙළෙඳ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන පිළිබඳව නවක උපාධිධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	81	දින 03	60,097.00	-	දේශීය	නවක උපාධිධාරීන් වෙළෙඳ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන පිළිබඳ දැනුමක් ලබාගැනීම
02	ජාත්‍යන්තර වෙළෙඳාම හා වෙළෙඳ ප්‍රවණතා පුහුණු වැඩසටහන	44	දින 01	23,345.00	-	දේශීය	ජාත්‍යන්තර වෙළෙඳාම හා වෙළෙඳ ප්‍රවණතා පිළිබඳ අවබෝධයක් ලබාගැනීම
03	පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම	1	දින 01	4000.00	-	දේශීය	ඵලදායී ආකාරයෙන් පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම පිළිබඳ දැනුම ලබාගැනීම
04	කාර්යාල කාර්ය සහයක ප්‍රාථමික සේවා සේවයේ රාජකාරී පුහුණුව	7	දින 02	56,000.00	-	දේශීය	රාජකාරී ස්වාභාවය හා රාජ්‍ය ආයතනයන්හි සංවිධාන ව්‍යුහය හා පිළිපැදිය යුතු සාරධර්ම පිළිබඳ අවබෝධයක් ලබාගැනීම
05	රජයේ වාහන නඩත්තුව පිළිබඳ දැනුවත් කිරීමේ (මාර්ග ගත) පුහුණු වැඩසටහන	2	දින 01	10,000.00	-	දේශීය	රජයේ වාහන උපරිම කාර්යක්ෂමතාවතාවයෙන් හා අවම පිරිවැයකින් යුතුව පරිහරණය කළයුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම

	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වාභාවය (දේශීය / විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
06	ලිපිගොණුකරනය	1	දින 01	4000.00	-	දේශීය	ලිපිගොනුකරණය නිසි අයුරින් කිරීම පිළිබඳ දැනුම ලබාගැනීම
07	ලිපිගොණුකරනය පිළිබඳ පුහුණු වැඩසටහන	57	දින 02	43,210.00	-	දේශීය	නවක උපාධිධාරීන් ලිපිගොනුකරණය නිසි අයුරින් කිරීම පිළිබඳ දැනුම ලබාගැනීම
08	ප්‍රසම්පාදනය පිළිබඳ පළමු පුහුණු වැඩසටහන	33	දින 01	16.623.00	-	දේශීය	ප්‍රසම්පාදනය කටයුතු සිදුකරනු ලබන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම
09	ප්‍රසම්පාදනය පිළිබඳ දෙවන පුහුණු වැඩසටහන	31	දින 01	23.880.00	-	දේශීය	ප්‍රසම්පාදනය කටයුතු සිදුකරනු ලබන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම
10	මුදල් රෙගුලාසි පිළිබඳ පළමු පුහුණු වැඩසටහන	33	දින 01	15,880.00	-	දේශීය	මුදල් රෙගුලාසි පිළිබඳ මූලික අවබෝධයක් ලබාගැනීම
11	මුදල් රෙගුලාසි පිළිබඳ දෙවන පුහුණු වැඩසටහන	20	දින 01	42,730.00	-	දේශීය	මුදල් රෙගුලාසි පිළිබඳ මූලික අවබෝධයක් ලබාගැනීම
12	වැටුප් පරිවර්තන පිළිබඳ පුහුණු වැඩසටහන	21	දින 01	27,860.00	-	දේශීය	වැටුප් පරිවර්ථන කටයුතු සිදුකරනු ලබන නිලධාරීන් එම විෂය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම
13	Seminar for State-Owned Enterprise Executive of Developing Countries (Online)	01	දින 14			විදේශීය	To get knowledge about State-Owned Enterprise Executive of Developing Countries

	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වාභාවය (දේශීය / විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
14	Seminar on Smart Government for Developing Countries (Online)	02	දින 14			විදේශීය	To get knowledge about Smart Government for Developing Countries
15	Singapore Cooperation Programme Economy (Online)	02	දින 05			විදේශීය	To get knowledge about Cooperation Programme Economy
16	Seminar on Trade Promotion for Belt and Road Countries	01	දින 14			විදේශීය	To get knowledge about Trade Promotion for Belt and Road Countries
17	Seminar on International Market Expand for Developing Countries	01	දින 14			විදේශීය	To get knowledge about International Market Expand for Developing Countries
18	Integrated Logistic Supply Chain Management	01	දින 01			විදේශීය	To get knowledge about Integrated Logistic Supply Chain Management
19	Seminar on China Experience of Reform and Opening up for Developing Countries	03	දින 14			විදේශීය	To get knowledge about China Experience of Reform and Opening up for Developing Countries
20	Seminar on Development of E-Commerce and Retail Industry for Developing Countries	03	දින 14			විදේශීය	To get knowledge about on Development of E-Commerce and Retail

	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වාභාවය (දේශීය / විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
21	Online Course on Developed Market Oriented Export Promotion Strategy/Marketing Strategy (B)	02	දින 28			විදේශීය	To get knowledge about Developed Market Oriented Export Promotion Strategy/Marketing Strategy (B)
22	Seminar on Dairy Products and Food Processing Technologies	02	දින 14			විදේශීය	To get knowledge about Dairy Products and Food Processing Technologies
23	Online Bilateral Training Programme-Seminar on Economic Development and Planning for Sri Lnaka	01	දින 12			විදේශීය	To get knowledge about Economic Development and Planning
24	Singapore Cooperation Programme: Green Economy	02	දින 04			විදේශීය	To get knowledge about Green Economy

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)		අදාළ නොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම			
1.6	**වෙනත්**			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන ගිණුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය(GA – N20) යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ . 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරි වරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත වුයේ 2021 නොවැම්බර් මාසයේදීය	2022 වර්ෂයට සකස් කර ඇත.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ . 134(2) DMA/1-2020 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත වුයේ 2021 නොවැම්බර් මාසයේදීය	2022 වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත වුයේ 2021 නොවැම්බර් මාසයේදීය	ඉදිරි වසර සිට මේ සඳහා කටයුතු කරනු ලැබේ.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත වුයේ 2021 නොවැම්බර් මාසයේදීය	2022 වර්ෂයේ සිට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත වුයේ 2021 නොවැම්බර් මාසයේදීය	2022 වර්ෂයේ සිට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
7	**විගණන හා කළමනාකරණ කමිටු**			

7.1	DMA චක්‍රලේඛ 1-2020 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත වුයේ 2021 නොවැම්බර් මාසයේදී බැවින් හා පැවති කොවිඩ් වසංගතයෙන් ඇතිවූ බාධාව නිසා	2022 වර්ෂයේ සිට ඉදිරියට පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛනයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කම්ප්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	ඉන්ධන පාවිච්චියේ වෙනසක් නිරීක්ෂණය වී නැත	ඉදිරි වසරේ සිට පරීක්ෂා කරනු ලැබේ.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අක්‍රීය බැංකුව ගිණුම් නැත		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය,භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**අදායම් ගිණුම**			

15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදුකර තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ අදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	2019 වර්ෂයේ අගභාගයේ දී නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිතව ඇති හෙයින් කොවිඩ් -19 වසංගතය හමුවේ අත්‍යවශ්‍ය සේවාවන් හී කටයුතු පමණක් සම්බන්ධීකරණය කිරීම හා 2020 වසර අවසන් වන විටත් තනතුරු පුරප්පාඩුව පැවතීම	ඉදිරි වර්ෂයේ තුළ කිරීමට අපේක්ෂිතය.

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	2019 වර්ෂයේ අගභාගයේ දී නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිතව ඇති හෙයින් හා කොවිඩ් 19 වසංගතය හමුවේ අත්‍යවශ්‍ය සේවාවන් හී කටයුතු පමණක් සම්බන්ධීකරණය කිරීම හා 2020 වසර අවසන් වන විටත් තනතුරු පුරප්පාඩුව පැවතීම	කාර්යමණ්ඩලය සම්පූර්ණ කරගත් පසු සිදුකිරීමට අපේක්ෂිතයි.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදන කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		